## නැගණහිර ලන්ඩනයේ සිංහළ අවුරුදු උත්සවය

සිංහළ සුබසාධක සංගමය
මෙහෙයවන බක්මහ උළෙල
2009 අප්‍රියෙල් 19 වන ඉරුදින
දහවල් 1 - 6 දක්වා
නැගණහිර ලන්ඩනයේ ඊස්ට්හැම්හි
Plashet Girls School
Plashet Grove
East Ham, London E12
යන ස්ථානයේ දී පැවැත්වේ
Nearest Underground - East Ham

## චාර්ල්ස් ඇන්තනි තුවාල ලබයි



පියා සහ පුතා

**කො**ටි නායක වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ වැඩිමහළු පුත්‍රයා වන චාර්ල්ස් ඇන්තනි දැනට සති දෙකකට පෙර සිදුකරන ලද යුද හමුදා ප්‍රහාරයෙන් තුවාල ලැබූ බව දැනගන්නට ඇත. 23 හැවිරිදි ඔහු කොටි සංවිධානයේ තාක්ෂණ අංශය භාරව සිටින අතර දැන් සටන් පෙරමුණට පැමිණ කොටි කර්නල් ස්වර්නම් යටතේ සටන් වැද සිටින බවත් කියති. ප්‍රහාරයේ දී ස්වර්ණම් ද තුවාල ලැබී ය.

ප්‍රභාකරන් තම පුතාට චාර්ල්ස් ඇන්තනි යන නම තැබුවේ සිය සමීපතම සගයා මෙන්ම සංවිධානයේ දෙවැනියාව සිටි චාර්ල්ස් ඇන්තනි සීලන් සිහිවීම පිණිසය. සීලන් 1981 දී යාපනයේ දී හමුදා භටයන් දෙදෙනෙකුට වෙඩිතැබීය. ඒ ප්‍රථම හමුදා ඝාතනයයි. පසුව සීලන් සහ සගයන් දෙදෙනෙකු හමුදාවට අසු විය. හමුදා වෙඩි ප්‍රහාරයෙන් බරපතල තුවාල ලැබූ සීලන් අනෙක් සගයා වන අරුණට කීවේ තමා මරා දමන ලෙසය. අරුණ එසේ කළේය. සීලන්ගේ මරණයෙන් මහත් කම්පාවට පත් ප්‍රභාකරන් හමුදාවෙන් පළිගන්නට 1983 ජූලි 23 වෙනි දින තිරුනෙල්වෙලිහි දී හමුදා භටයන් 13 දෙනාගේ ඝාතනය සැළසුම් කළේ ය. 1983 ජූලි සිංහළ දෙමළ ගැටුමේ ඇරඹුම එයයි.

## 'Tigers do not represent anyone - certainly not the Tamil people' - says Lord Naseby



" The A9 road to Jaffna was reopened after 10 years. The only sinister element is that the Tigers have forced the Tamil civilians to go with them to provide a human shield. The UN estimates the numbers at 250,000 but other state 100,000, however nearly 50,000 have got out, despite the Tigers shooting some. Appeals have been made by the UN, the four Co-Chairs, the Red Cross and the civilians to leave as the area of jungle held by the Tigers gets smaller and smaller - but to no avail", states veteran monitor of Sri Lankan Affairs, Chair of All Party Parliamentarian Group Lord Naseby.

"People ask why there can't be a cease fire; the answer is that this terrorist group has held Sri Lanka to ransom for 25 years. They can surrender or be wiped out. The Tigers do not represent anyone - certainly not the Tamil people" he further asserted in a special report provided on Sri Lanka in **The House Magazine** titled, **'Ransomed in the last redoubt'**, on March.

## කොටි දෙමළ ජනතාව සඳහා නොවේ

**- නේස්බි සාමිවරයා කියයි**

" **A9** පාර අවුරුදු **10**කට පස්සෙ විවෘත වුණා. කොටි සංවිධානය සාමාන්‍ය වැසියන් බලෙන් අරගෙනගියා ඔවුන් මිනිස් පළිහක් ලෙස යොදා ගෙන මුවා වෙන්න. එතන 2,50,000 සෙනග ඉන්නවා කියනවා. 100,000 කියනවා. එක එක ගණන් කියනවා. කොහොම නමුත් දැනට සිවිල් ජනතාව 50,000 කට වඩා වෙඩිකාගෙන පැනලා රජයේ පාලන ප්‍රදේශයට ඇවිත් ඉන්නවා. එක්සත් ජාතීන්, සම සභාපතිවරු, රතුකුරුස සංවිධානය ආදී අය කොටින්ට ආයාචනා කරනවා සිවිල් වැසියන්ට යන්න ඉඩ දෙන්න කියලා එන්න එන්න කොටි අඩවිය දිනෙන් දින පුංචි වෙන නිසා. නමුත් වැඩක් වී නැහැ."

එසේ පවසන්නේ බ්‍රිතාන්‍යයේ සර්ව පාක්ෂික පාර්ලිමේන්තු කමිටුවේ සභාපතිවරයා මෙන්ම, ශ්‍රීලංකාවේ වර්තමාන අර්බුදයේ සැබෑ ස්වරූපය හොඳින් අධ්‍යනයකර සිටින නේස්බි සාමිවරයාය.

" සටන් විරාමයක් පණවන්නට බැරිදැයි සමහරු අහනවා. එයට පිළිතුර නම් මේ ත්‍රස්තවාදී කණ්ඩායම අවුරුදු 25 ක් ලංකාව බලහත්කාරයෙන් පීඩාවට පත්කරගෙන ඉඳලා තියෙන බවයි. ඒ නිසා දැන් එක්කෝ ඔවුන් ආයුධ බිමදමා ශ්‍රීලංකා රජයට යටත්විය යුතුයි. නැත්නම් සම්පූර්ණයෙන්ම අතුගෑවී යායුතුයි. ඒ දෙකෙන් එකක් තමයි ඊළඟට සිදුවිය හැක්කෙ.

කොටි සංවිධානය කිසිවෙකුගේ නියෝජිතයන් නොවෙයි. නිසැකවම ඔවුන් දෙමළ ජනතාව නියෝජනය කරන්නෙ නැති බව නම් මෙහිදී කිව හැකියි. "

නේස්බි සාමිවරයා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාවක එසේ ලියා තිබේ.

**කීර්ති**



## අගනා නිවසක් විකිණීම සඳහා ඇත

කුරුණෑගල නගරයට කි .මී. 3½ යි. නව මල්කඩුවාවට ආසන් නව රජයේ වන රක්ෂිතයට නුදුරින් පිහිටි පර්චස් 90 ක ඉඩමේ අළුතින් ගොඩනගන ලද දෙමහල් නිවස. වටේටම තාප්පයකි. වෙන්වූ නිවාස 3 ක් වශයෙන්ද ප්‍රයේජනයට ගත හැක. කාමර 6 ක්, නාන කාමර 4 ක්, ස්වක නාන කාමරයක් සහ ගරාජයකින් යුක්තය. නිවාඩු නිකේතනයකට හෝ පදිංචියට කදිමය. මිළ රුපියල් ලක්ෂ 140 යි.

*දුර කතන 037 4931613 සහ 0776419642*

## ♥ පැටියො ඩාලිං



" පැටියො දන්නවයි වැඩක්, අන්න මුලතිව්වල කොටුවෙලා ඉන්න ප්‍රභාකරන්ටයි අනික් කොටියන්ටයි ලන්ඩන්වල ඉන්න කොටි නැදෑයො එකතුවෙලා නැවක්ම පුරෝලා බඩු යවනවලු, කෑමයි එහාට ඕන කරන තව තව දේවලුයි...."

" තව තව දේවල් කිව්වෙ සයනයිඩ් කරල් ද?"

## Sinhala Lesson 132 සිංහළ පාඩම

### සිංහල ඉගෙනීමට පහසු මගක් !

### Future Causal Verb - අනාගත ප්‍රයෝජ්‍ය ක්‍රියා

**Observe how the verbs are conjugated in the following examples.**

1. මම සරත්ට කියා ලියුම් තැපැල් කරවා ගන්නෙමි
   මම සරත් ලවා ලියුම් තැපැල් කරවා ගන්නෙමි
   I will get Sarath to post the letters
2. ගුරුවරු ළමයි ලවා චිත්‍ර අන්දවන්නෝය
   Teachers will make/get the children to draw pictures
3. ඔබ වඩුවෙකු ලවා ලීබඩු සාදවන්නෙහිය
   You will make/get a carpenter to make furniture
4. විහිලුකාරයා අපව හිනස්සවන්නේය
   The comedian will cause / make us laugh
5. අපි කෝකියන් ලවා කෑම උයවන්නෙමු
   We shall / will get the cooks to cook food
6. ගුරුවරිය සිසුන් ලවා පන්තිකාමරය පිරිසිදුකරවයි
   The teacher gets students to clean the class room.

**Use the following causative verbs in sentences.**

කරවනවා කඩවනවා අඬවනවා අද්දවනවා සරසවනවා
ලියවනවා මරවනවා වැඩකරවනවා මස්සවනවා නිදිකරවනවා

**Try to recognise Causative Verbs and Participles in your reading and conversation and practise using them.**

♦ ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන
**Dr Subhadra Siriwardane - MA PhD London**

## හරස්පද ප්‍රහේලිකා 107

**හරහට :**
1 සිතට දැනෙන ප්‍රීතිය
4 ජනප්‍රිය ආහාරයකි
5 ජීවත්වීමට නැතුවම බැරිය
7 විස සහිත කෘමියෙකි
9 තැතිගන්වන හැඟීම
11 කම්කරුවෙකුගේ ආයුධ

**පහළට :**
1 ක්‍රියාවේ ප්‍රතිපල
2 මුහුණපාන ලැජ්ජාව සමහරු මෙසේද හඳුන්වති
3 කෝපයට පත් තැනැත්තා **6** රටවල් දැක්වෙන රේඛා චිත්‍ර
8 ගුවනේ හෝ ජලයේ යන යන්ත්‍රය **10** ශාලාව

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | | 3 | ■ |
| 4 | | ■ | 5 | 6 |
| 7 | | 8 | ■ | |
| | ■ | 9 | 10 | |
| ■ | 11 | | | |

***ගියවර නිවැරදි විසඳුම්***

**හරහට :** 1 තණ්හාව 4 නිමල 6 ලපය 8 මත් 9 පිනි 10 මාරුතය
**පහළට :** 1 තවලම 2 හානිය 3 වම 5 ලතෝනිය 7 පත්මා 9 පිත

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

## අළුත් අවුරුදු විශේෂ බතක්
## A Special New Year Rice

***අවශ්‍ය ද්‍රව්‍ය :***

| | |
|---|---|
| හාල් | කිලෝ ග්‍රෑම් 1½ |
| ලොකු ළූණු | ග්‍රෑම් 50 |
| සිහින්ව ලියාගත් ලීක්ස් | ග්‍රෑම් 25 |
| තම්බාගත් කුකුළු මස් | ග්‍රෑම් 100 |
| තම්බාගත් ඉස්සන් | ග්‍රෑම් 100 |
| තම්බාගත් කැරට් | ග්‍රෑම් 100 |
| සිහින්ව ලියාගත් ගෝවා | ග්‍රෑම් 100 |
| වියලි මිදි | ග්‍රෑම් 100 |
| බැදපු කජු | ග්‍රෑම් 100 |
| ගම්මිරිස් කුඩු | තේ හැඳි 1 යි |
| තෙල් | මේස හැඳි 2 |

***සාදන ක්‍රමය*** : හාල් සෝදා වතුර බේරාගන්න. ලොකු භාජනයකට තෙල් මේස හැන්දක් දමා ලිප තබා රත්වූ විට එයට ළූණු ටික දමා රන්වන් පාට වනතුරු බැදගන්න. ඉන් පසු එයට හාල් ටික එකතු කොට අවශ්‍ය තරමට වතුර හෝ මස් තම්බාගත් වතුර හෝ එක්කර බත උයන්න.

තවත් භාජනයකට තෙල් මේස හැන්දක් පමණ දමා රත්වූවාට පසු ඉස්සන්, මස්, වියලි මිදි, කජු එකට දමා බැදගන්න. ඒවා හොඳින් බැදුනාට පසු සිහින්ව කපාගත් එළවළු වර්ග ටිකද ඊට එකතුකර මිශ්‍රකර තවත් මඳ වේලාවක් බැදෙන්නට හරින්න. එසේ බැදුණු පසු බත් මිශ්‍රණය එයට එකතුකර හොඳින් මඳ රස්නයෙන් කළවම්කරන්න. අවශ්‍ය නම් හැඩ වැඩ පිණිස ඉස්සන් සහ පාස්ලි සුළුවෙන් එකතු කරන්න. මෙය අමුත්තන්ට සංග්‍රහ කිරීමට කදිම ආහාර වේලකි.

♦ *චන්ද්‍රි කරුණාරත්න* නුගේගොඩ Sri Lanka

Sam's
CHICKEN
CHICKEN
CHICKEN
සෑම්ස් චිකන්
Great Tasting! Great Value!
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432